# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,465 — 1958 අගෝස්තු 1 වැනි සිකුරාද — 1.8.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## III වැනි කොටස—ඉඩම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට |
|---|---|
| **ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :—** | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... | — |
| අවසාන නියෝග ... ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් ... | 1021 |
| ඉඩම් සංවර්ධන ආඥාපණත යටතේ දැන්වීම් ... | 1030 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් ... ... | 1031 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම ... | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

අංකය : කාණ්ඩ.ඒ.372/ජේ57ඇල්418(වීර්)

**1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ සංශෝධිත පනතින් සංශෝධනය කළ පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

(1) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑකෝරලේ මැදපත්තුවේ අමුණුගොඩ පිහිටි අක්කර 2ක පමණ විශාලකම් ඇති ගලබොඩවත්ත නොහොත් හුලුකැලේ යන ඉඩම. ඊට මායිම් :—

උතුරට : ඒ. පී. රූපසිංහ අයිතිකම් කියන ගලබොඩවත්ත යන ඉඩම.
නැගෙනහිරට : බී. ජේ. පීරිස් අයිතිකම් කියන ගලබොඩවත්ත යන ඉඩම.
දකුණට : අමුණුගොඩ ගම්සහා පාර සහ ඩී. ඊ. සූරවීර අයිතිකම් කියන හොරගහලන්ද යන ඉඩම.
බස්නාහිරට : අමුණුගොඩ ගම්සහාපාර සහ බී. ඒ. ඩබ්ලිව්. බබෝ සිංඤෝ සහ අනිත් අය අයිතිකම් කියන ඉඩම.

(2) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑකෝරලේ මැදපත්තුවේ අමුණුගොඩ පිහිටි අක්කර 5ක පමණ විශාලකම් ඇති හොරගහලන්ද නොහොත් සේදිරිස්වත්ත යන ඉඩම. ඊට මායිම් :—

වයඹට : ජී. සේදිරිස් ද හරමානිස් අයිතිකම් කියන ඉඩම.
නිරිතට : ඉඹුල්ගොඩ-ගනේමුල්ල ප්‍රසිද්ධ පාර.
ඊසානට : ජී. ඒ. ඇම්. පෙරේරා සහ අනිත් අය අයිතිකම් කියන පයිනෝරුදෙනිය යන ඉඩම.
ගිණිකොනට : ඇම්. ඩී. මර්තේලිස් ප්‍රනාන්දු අයිතිකම් කියන තල්ගහවත්ත යන ඉඩම.

1958ක්වූ අප්‍රියෙල් මස 7 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

1021—ජේ. ඇන්. බී 4940—917 (7/58)

අංකය : ජේ. 57 ඊ 325 ; ආර්/කිව් 182

**1954 රේ අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධනය කරන ලදපරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥ පනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි.

කොළඹ දිසාවේ කොළඹ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ සල්පිටි කෝරළේ අත්තිඩියේ පිහිටි කෝන්ගහවත්ත නම් ඉඩමෙන් රූඩ 2 ක් පමණ විශාල කැබැල්ලට මායිම් :—

උතුරට : සී/මලගලගේ රජයේ සිංහල මිශ්‍ර පාසලේ ගොඩනැගිලි (රජය)
නැගෙනහිරට : රවෙල් නවරත්න සහ පී. එච්. ඩී. පෙරේරා මහත්වරු අයිතිකම් කියන කෝන්ගහවත්ත නම් ඉඩම.
දකුණට :. පී. එච්. ඩී. පෙරේරා මහතා අයිතිකම් කියන කෝන්ගහවත්ත නම් ඉඩම
බස්නාහිරට : රත්මලාන-නුගේගොඩ පී. ඩබ්ලිව්. ඩී. පාර.

1958 ක්වූ ජූලි මස 16 වැනි දින,
කොළඹ දී ය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති

---

අංකය : ජේ. 57 ඊ 516 ; ආර්/කිව් 190

**1954 අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**5වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කොළඹ දිසාවේ, කොළඹ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ කෝට්ටේ පළාත් ආණ්ඩු සභා සීමාව තුළ ඇතුල් කෝට්ටේ අංක 521 ගම්පති වසමේ පිහිටි පර්චස් 10.5 ක් පමණ විශාල තෙළඹුගහවත්ත නම් ඉඩමට මායිම් :—

උතුරට : බත්තරමුල්ල පාර
නැගෙනහිරට : ශ්‍රී පැරකුම්බා පිරිවෙන් විහාර පාලක භික්ෂු සංගමය අයිතිකම් කියන ඉඩම,
දකුණට : ඇම්. ජේ. ඒ. පෙරේරා අයිතිකම් කියන ඉඩම.
බස්නාහිරට : නන්දිසාර මාකලන්ද අයිතිකම් කියන බත්තරමුල්ල පාරේ වරිපනම් අංක 2 දරණ ඉඩම.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

1958 ක්වූ ජූලි මස 18 වැනි දින,
කොළඹදීය.

---

**1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවෙල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ආදයම් කොට්ඨාශයේ , නාරන්පනාව ගම්මුලාදැනි කොට්ඨාශයේ දිසානැක්ගම්මැද්ද ගමෙහි පිහිටි, ගල්පිහිල්ල වතුයායේ, හැල්ටන් කොට්ඨාශයෙන් රූඩ 3ක් පමණවූ පහත මායිම් සඳහන් බිම්කැබැල්ල :—

උතුරට, නැගෙනහිරට සහ දකුනට-එම ඉඩමේ ඉතිරි කොටස්,
බස්නාහිරට—ගම්සභා පාර.

අංකය : ඇල්. ඩී. ඩී. 9 ජේ 57/58 ඇල්ජී. 334,

1958 ක්වූ ජූලි මස 16 වැනි දින
කොළඹදීය.

සී. පී. ද. සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

---

අංකය : 3/40/35

**1954 අංක 39 දරන රජයට ඉඩම් ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත පරිදි 1950 හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**5වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබා ගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබා ගන්නා බවත් 1954 රේ අංක 39 දරණ රජයට ඉඩම් ගැනීමේ (සංශොධිත) ආඥ පණතින් සංශොධිත පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥ පණතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි.

(1) මාතලේ දිස්ත්‍රික්කයේ, දකුණු මාතලේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ කොහොන්සිය පත්තුවේ , හුලංගමුව-හරස්ගම ගම්මුලාදැනි කොට්ඨාසේ අගලවත්ත සහ කන්දේගෙදර යන ගම්වල (නගර සභා කොටසින් පිටත කොටස) පිහිටි හුලංගමුව නමැති වත්තෙන් -(ඉඩම මැදින් යන ගම්කාර්ය සභා පාර හැර) අක්කර 6 රූඩ 3 පර්චස් 10 ක පමණ බිම් ප්‍රමාණය ;

ඊට මායිම් :—

උතුරට : එච්. ඇම්. කළුබණ්ඩා අයිතිකම් කියන දඹගහමුලහේන නමැති ඉඩම සහ කේ. ඩී. ලීලා අයිතිකම් කියන දීගලවත්ත නමැති ඉඩම,
නැගෙනහිරට : බ්‍රාහ්මණ ඇල, කේ. ඩී. ලීලා අයිතිකම් කියන රෝසරගේ වත්ත නමැති ඉඩම, ගම්කාර්ය සභා පාර සහ එම ඉඩමේ කොටසක්,
දකුණට : ඩී. ඇම්. වීරකෝන් අයිතිකම් කියන කිරපුනාවේ වත්ත,
බස්නාහිරට : පූලියේ ඇල, යූ. හින්අප්පු අයිතිකම කියන අට්ටික්කාගහ මූලහේන නමැති ඉඩම, ගම්කාර්ය සභාපාර එච්. ජේම්ස් පෙරේරා අයිතිකම් කියන ගොඩමඩිත්තේහේන නමැති ඉඩම, බ්‍රාහ්මණ ඇල සහ පී. ඇම්. පී. කන්දේගෙදර සහ ඇල්. බී. හරස්ගම මහත්මිය අයිතිකම් කියන කුකුල්හේන.

(2) මාතලේ දිස්ත්‍රික්කයේ, දකුණු මාතලේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ, කොහොන්සිය පත්තුවේ, හුලංගමුව–හරස්ගම ගම්මුලාදෑනි තැනගේ සහ නගර ගම්මුලාදෑනි (සිංහල) කොටසේ කන්දේගෙදර සහ දෙඩම්දෙනිය (මාතලේ නගර සභාවෙ වෝඩ් 3) යන ගම්වල පිහිටි හුලංගමුව නමැති වත්තෙන් අක්කර 4. රූඩ්. 2 පර්චස් 10 ක පමණ බිම් කොටස :

ඊට මායිම් :—

උතුරට : ගම්කාර්ය සභා පාර සහ මාටින් රණවීර අයිතිකම් කියන අට්ටික්කාගහමුලහේනවත්ත නමැති ඉඩම,
නැගෙනහිරට : විල්ට්ෂයර් පාර,
දකුණට : සී. දෙන් වික්ටර් අයිතිකම් කියන ගම්බිරිගහමුලහේනවත්ත සහ අට්ටික්කාගහමුලහේන, ඇල්. ඩී. විලියම් අයිතිකම් කියන ගම්බිරිගහමුලහේනවත්ත සහ ඇල්. ඩී. විලියම් අයිතිකම් කියන ගල්ගොඩේහේන,
බස්නාහිරට : වත්තේ පාර..

(3) මාතලේ දිස්ත්‍රික්කයේ, දකුණු මාතලේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ, කොහොන්සිය පත්තුවේ, හුලංගමුව–හරස්ගම ගම්මුලාදෑනි කොටසේ, කන්දේගෙදර ගමේ පිහිටි හුලංගමුව වත්ත නමැති ඉඩමෙන් අක්කර 1 රූඩ් 1 පර්චස් 05 ක පමණ තනිව පිහිටි බිම් ප්‍රමාණය.

ඊට මායිම් :—

උතුරට සහ බස්නාහිරට : ඒ. ඉරිදියන් මහත්මිය සහ තවත් අය අයිතිකම් කියන හැම්ෂයර් වත්ත,
නැගෙනහිරට : ඒ. ඇම්. කලුබන්ඩා අයිතිකම් කියන ඉපිටිගෙදර වත්ත,
දකුණට : පූලියේ ඇල.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

1958 ක්වූ ජූලි මස 22 වැනි දින,
කොළඹ දී ය.

---

අංකය : ඇල් ඩී/ඇල්ඊ 60

## 1954 අංක 39 දරණ (සංශොධිත) ඉඩම් ලබාගැනීමේ ආඥපනතෙන් සංශොධනය කරනලදපරිදි 1950 හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ (සංශොධිත) ඉඩම් ලබා ගැනීමේ ආඥ පණතේ සංශොධනය පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

පහත සඳහන් පරිදි මායිම් වී ඇති, නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ආදයම් පාලක නිලධාරි කොට්ඨාශයේ කුඹල් ඔලුව ගම්මුලාදෑනි කොට්ඨාශයේ පිහිටි පල්ලරකැලේ වත්තෙන් අක්කර 13 රූඩ් 3 පර්චස් 11ක් පමණ වූ ඉඩම් කට්ටි තුනයි.

(අ) ප්‍රමාණය : අක්කර 1යි රූඩ්1ක් පමණ වේ.

උතුරෙන් පී. ඩබ්ලිව්. ඩී. පාරද
නැගෙනහිරින් : ඇම්. ජී. අප්පුහාමි විසින් අයිතිවාසිකම් දක්වන පතිගෙදරවත්ත නැමති ඉඩමද බී. ජී. පුංචා විසින් අයිතිවාසිකම් කියා සිටින නවරිකොටුව වත්ත ද,
දකුණෙන් : ඩබ්ලිව්. ජී. ජේම්ස් විසින් අයිතිවාසිකම කියා සිටින ගල්පදලම වත්ත ද,
බටහිරින් : පී. ඩබ්ලිව්. ඩී. පාර ද වේ.

(ආ) ප්‍රමාණය අක්කර 1යි රූඩ් 1ක් පමණ වේ.

උතුරෙන් : ඩබ්ලිව්. ජී. ජේම්ස්ට අයත් දිඹුල්ගහලියැද්ද නැමැති ඉඩම ද,
නැගෙනහිරින් : ඇම්. ජී. අප්පුහාමිට අයත් පතිගෙදරවත්ත නැමැති ඉඩම ද;
දකුණෙන් : පී.ඩබ්ලිව්.ඩී. පාර හා ටී. ඇස්. පිරිස් විසින් අයිතිවාසිකම් දක්වන මායාවත්ත ද ආර්. ජී. සංගෝ විසින් අයිතිවාසිකම් දක්වන කැකිරාවත්ත ද,
බටහිරින් : ආර්. ජී. සංගෝට හිමි කැකිරාවත්තද, පී. සෙලෙස්තිනාහාමිට හිමි කැකිරාවත්තද, පී. සෙලෙස්තිනාහාමිට හිමි කෙසෙල්ලියැද්ද ද වේ.

(ඉ) ප්‍රමාණය අක්කර 11යි රූඩ් 1 පර්චස් 11ක් පමණ වේ.

උතුරෙන් : පී.ඩබ්ලිව්.ඩී. පාර සහ වොයිසි වත්ත ද,
නැගෙනහිරින් : වොයිසි වත්ත හා එම ඉඩමෙන් ම කොටසක්,
දකුණෙන් : පී. සයිනෝරිස් හා ටී. සිංඤෝ බබා විසින් අයිතිවාසිකම් කියා සිටින මැදවත්ත ද,
බස්නාහිරින් : පී. සයිනෝරිස් විසින් අයිතිවාසිකම් කියා සිටින තැන්නෙවත්ත ද, ඇලද, පී.ඩබ්ලිව්.ඩී. පාර ද වේ.

අංකය : ජේ/55ඇල්/285 (වීඊ)

1958ක්වූ ජුනි මස 23 වැනි දින,
කොළඹදීය.

චාල්ස් පර්සිවල් ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

අංකය : එල්/ඩී. එල්ඊ/ 83.

## 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ආදයම් පාලක නිලධාරි කොට්ඨාශයේ මලුල්ල ගම් මුලාදෑනි කොට්ඨාශයේ හකුරතලේ ගම පිහිටි ප්‍රමාණයෙන් අක්කර 1½ක්වූ පහත සඳහන් ඉඩම් කට්ටි දෙක.

(1) කොහොඹගහමුලවත්ත උඩගෙදර වත්ත ගෙපොල (කැබලි 3යි) දඹගහමුලවත්ත, දඹගහමුලහේන සහ කෝන්ගහමුල වත්ත යන යාබදව පිහිටි බිම් කැබලි 8 ; පහත සඳහන් පරිදි මායිම් වී ඇත.

**උතුරෙන් :** ඒ. ඩිංගිරිබණ්ඩාට අයත් ගෙපල නමැති ඉඩම ද,

**නැගෙනහිරින් :** ඩබලිව්. වික්‍රමසිංහට අයත් අඹගහවෙල කුඹුර නැමැති ඉඩම ද,

දකුණෙන් : ගම්සභා පාරෙන් ද,

බස්නාහිරින් : ඒ. ජී. හේරත්හාමිට අයත් උඩගෙදර වත්ත නැමැති ඉඩම ද වේ.

(2) පහත සඳහන් පරිදි මායිම් වී ඇති වත්තෙගෙදර වත්ත හා අඹවත්ත යන යාබද ඉඩම් කැබලි දෙක :—

උතුරෙන් : ගම්සභා පාරෙන් ද,
නැගෙනහිරින් : ඒ. ජී. ටිකිරිමැනිකාට අයත් වත්තෙගම්මැද්ද ඉඩම නැමැති ඉඩම ද,
දකුණෙන් : ඒ. ජී. හීන්බණ්ඩාට අයත් වත්තෙගෙදර ඉඩම නැමැති ඉඩම ද,
බස්නාහිරින් : ඩබ්ලිව්. ජී. රන්බණ්ඩා, ඩබ්ලිව්. ජී. හීන්බණ්ඩා සහ ඩබ්ලිව්. ජී. අප්පුහාමි විසින් අයිතිවාසිකම් කියන වත්තෙගෙදර වත්ත නැමැති ඉඩම ද වේ.

අංකය : ජේ/56ඊ 285.

1958ක්වූ ජූලි මස 3 වැනි දින,
කොළඹ දීය.

චාල්ස් පර්සිවල් ද සිල්වා.
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

## 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950හේ අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥපණතේ (5) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ඉඩම් හා ඉඩම්, සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

ගාලු දිස්ත්‍රික්කයේ ගහබඩ පත්තුවේ, බොරලුකඩ සහ පහලකිඹිය නමැති ගම්මුලාදැනි වසම් තුල පිහිටි, බොරලුකඩ සහ පහලකිඹිය නමැති ගම් තුල පිහිටා තිබෙන වරකපිටකන්ද නොහොත් ඉඹුල්විටිගලකන්ද (අංක 12,470 දරණ මූලික සැලැස්මේ අංක 2, 5 සහ 6 දරණ බිම් කැබලි) නමැති අක්කර 80ක් පමණ වූ ඉඩම. ඊට මායිම් :—

උතුරට : අංක 12,141 දරණ මූලික සැලැස්මේ අංක 4 සහ 6 දරණ බිම් කැබලි සහ අංක 11,653 දරණ මූලික සැලැස්මේ අංක 3 දරණ බිම් කැබැල්ල,
නැගෙණහිරට : අංක 12,141 දරණ මූලික සැලැස්මේ අංක 8 දරණ බිම් කැබැල්ල,
දකුණට : පඹේහේනෙදෙනිය, කන්දෙහේනෙ මුලනකුඹුර නමැති ඉඩම් සහ අංක වී.පී. 265435, 265531 සහ 265436 වලින් පෙන්නුම් කරන ඉඩම්,
බස්නාහිරට : අංක ඒ.1,492 දරණ මූලික සැලැස්ම සහ මල දෙල.

අංක : ඇල්.සී./ඒ. 351. ජේ.57/58 ඇල්.207 (ඩී.ඊ.)
1958ක්වූ ජූලි මස 16 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 රේ අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥපනතෙන් සංශොධනය කරන ලද 1950හේ අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි:

1. කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරලේ දැදිගම වසමේ දැදිගම ගමේ පිහිටා තිබෙන ගෙදරවත්ත නමැති ඉඩමෙන් අඩි 143 × 14 පමණ ප්‍රමාණය ඇති බිම් තීරුව. ඊට මායිම් :—

උතුරට : ගම්කායාර් සභා පාර ;
නැගෙනහිරට : ඕ. ආර් පොඩිඅම්මා සහ තවත් අය අයිතිකම් කියන ගෙදරවත්ත ;
දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස ;
බස්නාහිරට : කේ. ආර් . පීරිස් සිංඤෝ සහ තවත් අය අයිතිකම් කියන හිටිනාවත්ත.

2. කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරලේ දැදිගම වසමේ දැදිගම ගමේ පිහිටා තිබෙන හිටිනාවත්ත නමැති ඉඩමෙන් අඩි 174 × 14 පමණ ප්‍රමාණය ඇති බිම් තීරුව. ඊට මායිම් :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස ;
නැගෙනහිරට : නෙලුන්දෙනිය–තුන්කොට ප්‍රසිධ මහපාර ;
දකුණට : යොජිත පාර.
බස්නාහිරට : කේ. ආර්. පීරිස් සිංඤෝ අයිතිකම් කියන හිටිනාවත්ත.

අංකය : ජේ55/එල්.ජී453/එල්.එම්.5595.

1958ක්වූ ජූනි මස 23 වැනි දින
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

---

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥපනතෙන් සංශොධනය කරන ලද 1950හේ අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥපනතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

1. කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ සහ කිණිගොඩ දෙකෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොටසට අයත් වල්ගම වසමේ උඩුගම ගමේ පිහිටා තිබෙන රටතිඹුරේහේන නමැති ඉඩමෙන් පර්චස් 9ක් පමණ ප්‍රමාණය ඇති බිම් කොටස. ඊට මායිම් :—

උතුරට, නැගෙනහිරට සහ බස්නාහිරට: එම ඉඩමේ ඉතිරි කොටස,
දකුණට : ඔය.

2. කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ සහ කිණිගොඩ දෙකෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරිතැනගේ කොටසට අයත් වල්ගම වසමේ, උඩුගම ගමේ පිහිටා තිබෙන ඊදල්ල වත්තෙන් පර්චස් 3ක් පමණ ප්‍රමාණය ඇති බිම් කොටස. ඊට මායිම් :—

උතුරට : ඔය.
නැගෙනහිරට, දකුණට සහ බස්නාහිරට; එම ඉඩමේ ඉතිරි කොටස්.

අංකය: ජේ57/58 ඇල් 211/එල්.එම්.5717.
1958ක්වූ ජූලි මස 9 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥපනතෙන් සංශෝධනය කරනලද 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කෑගල්ල දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරළේ ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගේ කොටසට අයත් බස්නාහිර තුන්පලාත පත්තුවේ අම්බලකන්ද ගමේ පිහිටා තිබෙන බර්ට්ෆීල්ඩ් වත්තෙන් අක්කර 6, රූඩ් 1, පර්චස් 37·8 ක් පමණ ප්‍රමාණය ඇති බිම් කොටස, ඊට මායිම්:—

උතුරට : අම්බලකන්ද-අරණායක ප්‍රසිඩ පාර,
නැගෙනහිරට : අම්බලකන්ද පන්සල අයිතිකම් කියන පන්සල වත්ත සහ වයි. නන්දෙරිස් අයිතිකම කියන වත්තෙලාගේ වත්ත.
දකුණට : ජී. කිරිහතනා අයිතිකම් කියන වත්තෙලාගේ වත්ත, යූ. පින්චා අයිතිකම් කියන පහලවෙල සහ එම ඉඩමේ ඉතිරි කොටස,
බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස සහ අම්බලකන්ද-අරණායක ප්‍රසිඩ පාර.

අංකය : ජේ.57/58 එල්. 32(වීර්)/එල්.එච්.923.

1958ක්වූ ජූලි මස 9 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥපනතෙන් සංශොධනය කරන ලද 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියෙ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොටසට අයත් කෙහෙල්වතුගොඩ වසමේ කෙහෙල්වතුගොඩ ගමේ පිහිටා තිබෙන කලඹටුවාවහේන නැමති ඉඩමෙන් අ 0, රූ 2, ප. 29ක් පමණ ප්‍රමාණය ඇති බිම් කොටස. ඊට මායිම් :—

උතුරට : සෙන්ට් පර්ගස් වත්තේ පාර,
නැගෙනහිරට : වෙලහේනවත්ත සහ මල ඇල,
දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස,
බස්නාහිරට : කන්දගොල්ලවත්ත සහ එම ඉඩමේ ඉතිරි කොටස.

අංකය. ජේ57/58 ඊ. 140/එල්.එම්.5712.

1958ක්වූ ජූලි මස 3 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

## 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත්, 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥපනතින් සංශොධනය කරන ලද, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරළේ සහ පහත බුලත්ගම ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොටසට අයත් තෙල්කුමුදුවල වසමේ සන්නල ගමේ පිහිටා තිබෙන රූප්පේඹිට්ට නමැති ඉඩමෙන් අක්කරයක් පමණ ප්‍රමාණය ඇති බිම් කොටස. ඊට මායිම්—

උතුරට : අංක පී. පී. ඒ. 495 මැන වෙන් කර තිබෙන කෑග./පන්නල රජයේ සිංහල මිශ්‍ර පාසැලේ වත්ත,
නැගෙනහිරට : කිරිපෝරුව වතුයායේ පාරා කොටස,
දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස,
බස්නාහිරට : පන්නල-මත්තමගොඩ ගම්කායසී සභා පාර.

අංකය : ජේ. 57 ඊ 503/එල්. එම්. 5696.

1958 ජූලි මස 16වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

අංකය : ඇල් එච්/ඒ 1.

## 1954 රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධනය කරන ලද පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7වැනි වගන්තියේ (1)වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර—

**පිහිටීම : මූලික සැලැස්ම නො. ඒ. 4,096 හි කැබලි 1—කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුනේ මහ පයියාගල**

| කැබලි නො. | නම | විස්තරය | හිමිකම් කියන අය | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1. | වැල්ලබඩමහවත්ත ... | පොල් වත්ත, අවුරුදු 50ක් වයසැති ගස් 60ක් සහ තාවකාලික පැලක් | ජීම් ජයවර්ධන, පයියාගල ; ලෙස්ලි පෙරේරා, ආදයම් පාලක නිලධාරි කායාීලය, නුගේගොඩ ; ඇන්. එලාරිස් කුරේ, වාද්දුව ; දෙන් ඩේවිඩ් ජෝජ් වීරකෝන් සහ දෝනා චාලට් වීරකෝන්, පයියාගල; ඇන්. ඇම්. පෙරේරා මහත්මිය, 52, උස්වැටකෙයියාව, කඳාන | 1 2 15·1 |
| | | | | 1 2 15.1 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටිනසියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 සැප්තැම්බර් 23වැනි දින පූ. භා. 10ට කලුතර කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958 සැප්තැම්බර් 15වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958 ජුලි 22 වැනි දින,
කළුතර කච්චේරිය.

රිජ්වේ තිලකරත්න,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

---

අංකය: ඇල් ඩී. 4989

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව්1954 හි අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධනය කරණලද 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය ආදයම් කොට්ඨාශයේ මැදසියපත්තුවේ හේදෙණිය ගමෙහි පිහිටි නාරන්ගොඩ නමැති ප්‍රමාණයෙන් අක්කර 28ක් වූ මූලික ප්ලෑන් අංක ඒ2,505හි කැබලි අංක 1 සහ 2 යනුවෙන් මැන විස්තර කරණලද දැනට වැරැල්ලගම හේදෙණිය පදිංචි ඊ. පී. ජයසිංහ මහතා විසින් අයිතිවාසිකම් කියනු ලබන ඉඩම :

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම් තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 සැප්තැම්බර් මස 9 වන දින පෙරවරු 10 ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958 සැප්තැම්බර් මස 2 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

තවද ඒ ඉඩම සම්බන්ධව ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරුකර ගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධවද ඇති සියලුම ඔප්පු සහ ලියකියවිලිද මේ කරුණ සම්බන්ධව පවත්වනු ලබන විභාගයේ දී ඉදිරිපත් කළ යුතුයි.

1958 ක්වූ ජූලි මස 24 දින
මහනුවර කච්චේරියේදිය.

ඒ. බී. ඇස්. ඇන්. පූල්ලෙනායගම්,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

---

අංකය : ඇල්. ඩී. 4920.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් 1954හි අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධනය කරණලද 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය ආදයම් කොට්ඨාශයේ කළුගම්මනසිය පත්තුවේ උඩුවාවල ගමෙහි පිහිටි බලගොල්ල නමැති ප්‍රමාණයෙන් අක්කර 14, රූඩ් 3, පර්චස් 23 ක් වූ මූලික ප්ලෑන් අංක ඒ 2500 කැබලි අංක 1 යනුවෙන් මැන විස්තරකරණලද දැනට මහනුවර පේරාදෙණිය පාරේ පදිංචි එච්. බී. උඩුරාවණ විසින් අයිතිවාසිකම් කියනු ලබන ඉඩම :

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 සැප්තැම්බර් මස 11 වන දින පෙරවරු 10 ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958 සැප්තැම්බර් මස 4 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මාවෙත (පිටපත් දෙකක් සහිතවූ (ලියවිල්ලකින් දැනුමදිය යුතුයි.

තවද ඒ ඉඩම සම්බන්ධව ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරුකර ගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධවද ඇති සියලුම ඔප්පු සහ ලියකියවිලිද මේ කරුණු සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

1958ක්වූ ජූලි මස 24 දින
මහනුවර කච්චේරියේදිය.

ඒ. බී. ඇස්. ඇන්, පූල්ලෙනායගම්,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

---

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

ඇල්ඩී 4861

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධනය කරණ ලද පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර සහ යටිනුවර ප්‍රාදේශීය ආදයම් කොට්ඨාශයේ, මැද පලාත කෝරළේ (උඩුනුවර) දස්කර ගමේ පිහිටි මුල් ප්ලෑන් නො: ඒ 2,512 ලොට් නො: 1 සහ 2 වශයෙන් හැඳින්වෙන අක්කර 20 පාර්චස් 22 ක්වූ ඇත්ලොන් වත්තේ ගල්කඩුව කොටස.
අයිතිවාසිකම් කියන්නේ ගම්පොල ඇත්ලොන් වත්තේ පදිංචි ඇස්. ජිනදාස මහතා.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 සැප්තැම්බර් මස 16 වන දින පෙරවරු 9. 30 ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 1958 සැප්තැම්බර් 9 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල් ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිත වූ) ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. ඉඩම සම්බන්ධව ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධවද ඇති සියලුම ඔප්පු සහ ලියකියවිලි ද මේ කරුණු සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ජේ. බී. ඇස්. ඇන්. පුල්ලෙනායගම්,
ම. දි. ආණ්ඩුවේ ඒජන්තතුමා.

වර්ෂ 1958 ක්වූ ජූලි මස 24 දින,
මහනුවර කච්චේරියේදීය.

---

සඳහන් අංකය : 3/40/27.

## 1954 අංක 39 දරණ ඉඩම් රජයට ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනත

**7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

මහාජන කාර්‍ය්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර :—

පැලෑන—මූලික සිතියම් අංක ඒ. 2520. ගම—දූල්ලෑව

| කැබැල්ල | නම | විස්තර | අයිතිකම් කියන්නා | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | දූල්ලෑව වත්ත ... | ... තැනින්තැන ඇති පහත සඳහන් ගස් සහ අවුරුදු 30 ට වැඩි රබර් සහ කොකෝ : අවු. 30–40 පොල් ගස් 5, අවු. 20–40 කොස් ගස් 9 අවු. 10–30 ලුනුමිදැල්ල 6, අවු. 10–30 සපු ගස් 11, අවු. 5–20 රට දෙල් 25 සහ අවු. 40–50 පමණ වූ තේ පඳුරු කිහිපයක් සහ ගල් පර්වතයක් | මහවෙල, පල්දෙනියේ ටී. ඇස්. වේරගම, ගලේවෙල, කඳන, බෙලිගමුවේ විසාකා දූල්ලෑව මහත්මී සහ මාතලේ, මොයිසි ක්‍රිසන්ට් පාරේ අංක 20 හි පදිංචි ඩබ්ලිව්. ඇල්ලේපොල මහත්මිය ... | 27 1 27 |
| | | | | 27 1 27 |

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1958 අගෝස්තු මස 29 දින පෙ.ව. 10.30 ට මාතලේ කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1958 අගෝස්තු 22 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

වී. පී. ඒ. පෙරේරා,
මාතලේ ආණ්ඩුවේ ඒජන්ත.

මාතලේ කච්චේරිය.
1958 ජූලි මස 19 දය.

---

සඳහන් අංකය. : 3/40/69

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධිත පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපණත

**7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

මහාජන කාර්‍ය්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර :—

පැලෑන—මූලික සිතියම් අංක : ඒ 2518. ගම—දොඹගොඩ

| කැබැල්ල | නම | විස්තර | අයිතිකම් කියන්නා | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ... රත්වත්ත වත්ත | ... (පාලුවට හැරිය) අවුරුදු 30 ට වැඩි රබර් සහ පාර | කොළඹ, ජෝර්ජ් ස්ටුවර්ට් සහ සමාගම ... | 13 1 13 |

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1958 අගෝස්තු මස 29 දින පෙ.ව. 11.30 ට මාතලේ කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1958. 8. 22 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

වී. පී. ඒ. පෙරේරා,
මාතලේ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

මාතලේ කච්චේරිය,
1958 ජූලි මස 19 දය.

---

සඳහන් අංකයඃ 3/40/66

## 1954 අංක 39 දරණ රජයට ඉඩම් ගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධිත පරිදි 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනත

**7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

මහාජන කාර්‍ය්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර :—

පැලෑන—මූලික සිතියම් අංක : ඒ 2519. ගම—පිටකන්ද

| කැබැල්ල | නම | විස්තර | අයිතිකම් කියන්නා | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | බන්ඩාරපොල වත්ත ... | අවුරුදු 10 වැඩි කොකෝ අතරින් පතර වවා ඇති අවුරුදු 20 ට වැඩි රබර් | මාතලේ, සීමාසහිත බන්ඩාරපොල වතු සමාගම | 4 2 32 |

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1958 අගෝස්තු මස 29 දින ප.ව. 2.30ට මාතලේ කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තරද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තරද 1958.8.22 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

මාතලේ කච්චේරිය,
1958 ජූලි මස 19 දය.

වී. පී. ඒ. පෙරේරා,
දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

---

යොමු අංකය : ඇල්ජ්. 3593

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

7වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප.වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර—

අංක ඒ 1528 දරණ මූලික සැලැස්ම. ගම—කුන්දලෙයි

| කට්ටි | ඉඩමේ නම | විස්තර | හිමිකම් පාන්නාගේ නම | අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1. | ජේමඩු ... | දිය කඩිති 2ක් සහ ළිඳක්ද, අවුරුදු 50ක් පමණ පැතිරී ඇති පොල් ගස් සහිත දෙණියක් සහ ළිඳක් සහ පොල් අතු වලින් සාද ඇති පැල්පත් 3ක් ද, කාණුද, (පැතිරී ඇති) ඒළවළු ද, අවුරුදු 1 සිට 2 දක්වා වයසැති පොල් පැළ සහ අවුරුදු 50ක් පරණ පොල් ගස් සහිත පොල් වත්තක් | පුත්තලමේ, ඊ. ඇස්. ඇම්. මොහමඩ් කාසිම් මරික්කාර් මහතා, ඊ. ඇස්. ඇම්. ඉබ්‍රහිම් නයිනා මරික්කාර් මහත්මිය සහ නයිනා මරික්කාර් මහත්මිය | 19 1 25 |
| | | | එකතුව ... | 19 1 25 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958වේ සැප්තැම්බර් මස 24වැනි දින පූ. භා. 10ට පුත්තලමේ කච්චේරියේදී මා සම්මුඛ වියයුතුයි.

තවද, 1958වේ සැප්තැම්බර් මස 17වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958වේ ජූලි මස 23වැනි දින,
පුත්තලමේ කච්චේරිය.

ආ. සී. නවරත්නරාජා,
ආණ්ඩුවේ ඒජන්ත තැන, පුත්තලම් දිස්ත්‍රික්කය.

---

යොමු අංකය : ඇල්ජ්. 3635.

## 1954 රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7වැනි වගන්තියේ (1)වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

අංක ඒ 1529 දරණ මූලික සැලැස්ම. ගම—මැරවල

| කට්ටි අංකය | ඉඩමේ නම | විස්තර | හිමිකම් පාන්නාගේ නම | වපසරිය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1. | බෘක්සයිඩ් වත්ත ... | පොල් ගස් සහිත අවුරුදු 50ක් පමණ (ජලාශ්‍රිත) දෙණියක කොටසක් සහ පැදු ළිඳක් සහ නෑමට සෑදූ භාජනයක්ද, පොල් අතු සෙවිලි කළ බදමයෙන් බඳින ලද වැසි කිළියක්ද, වහලය සින්ක් වලින් සාද උළු සෙවිලි කළ බංගලාවක් ද සහිත අවුරුදු 20–25 අතර පරණ පොල් වත්තක් | කොළඹ, උප ඉඩම් අධිකාරී, ඊ. කේ. ආර්. අසරප්පා මහතා ; ඉන්දියාවේ, බොම්බායේ, නැගෙනහිර මාවතේ, සාන්ත ක්‍රෘස්, " මාරි විලා " හි, අභස් නැවියෙක්වූ, එච්. ඇල්. ඒ. අසරප්පා මහතා සහ මැරවල, ආර්. ඊ. අසරප්පා මහතා | 29 1 02 |
| | | | එකතුව ... | 29 1 02 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958වේ සැප්තැම්බර මස 17වැනි දින පූ. භා. 11.30ට පුත්තලමේ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958වේ සැප්තැම්බර් මස 10වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958වේ ජූනි මස 23වැනි දින,
පුත්තලමේ කච්චේරිය.

ආ. සී. නවරත්නරාජා,
ආණ්ඩුවේ ඒජන්තතැන, පුත්තලම් දිස්ත්‍රික්කය.

යොමු අංකය: ඇල්ඒ. 3615

## 1954 අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වෙනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1)වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේවිස්තර :—

අංක. ඒ. 1,527 දරණ මූලික සැලැස්ම—ගම : විල්ලාරවාඩිය

| කට්ටි අංකය | ඉඩමේ නම | විස්තර | හිමිකම් පාන්නාගේ නම | වපසරිය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කුම්මෝදරවත්ත නොහොත් සෝමසුන්දරම් වත්ත | අවුරුදු 50ක් පරණ පොල් ගස් 2ක් සහ බදමයෙන් බදින ලද අල්තාරයක් සහිත දේවාල භූමිය සහ අවුරුදු 25ක් පරණ පොල් ගස් 7 සහිත හිස් බිමක්ද, අවුරුදු 25ක් පරණ පොල් ගසක් සහිත අවුරුදු 2ක් වයසැති පොල් සිටුවා ඇති කොට සක්ද, අවුරුදු 30ක් පරණ පොල් ගස් 2ක් සහිත (ගංවතුර මට්ටමෙන් පහත) හේනක්, (ගංවතුර මට්ටමෙන් පහත) කුඹුරක්ද, අවුරුදු 25ක් පරණ පොල් ගස් 2 සහිත (ගංවතුර මට්ටමෙන් පහත)සමතලා කැලෑවක්ද,(ගංවතුර මට්ටමෙන් පහත සහ කෘත්‍රිම) දියකඩිත්තක්ද, අවුරුදු 15–20ටත් අතර වයසැති තල්ගස් 2 ක් සහ අවුරුදු 25 ක් පරණ පොල් ගසක් සහිත (ගංවතුර මට්ටමෙන් පහත) මුඩු බිමක්ද, ළිඳක් සහ මැටියෙන් සාදන ලද ගෙවල් 2ක්ද, අවුරුදු 25–50 අතර වයසැති අරළු ගසක් සහ අඹ ගස් 3ක්ද, කොස් ගස් 5ක් සහිත අවුරුදු 25–50 ටත් අතර පරණ පොල් වත්තක් | කොළඹ, බම්බලපිටියේ, කොතලාවල කට්ටුවේ අංක 11යේ, සෝමසුන්දරම් මහාදේවන් මහතා සහ කොළඹ, රෝයල් විද්‍යාලේ ගුරුවරයෙක්වූ, ඇස්. මුතුකුමාර මහතා | 43 0 11.1 |
| | | | එකතුව ... | 43 0 11.1 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958වේ සැප්තැම්බර් මස 24 වැනි දින පූ.භා. 11ට පුත්තලමේ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958වේ සැප්තැම්බර් මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958වේ ජූලි මස 23 වැනි දින,
පුත්තලමේ කච්චේරිය.

ආ. සි. නවරත්නරාජා,
ආණ්ඩුවේ ඒජන්තතැන.
පුත්තලම දිස්ත්‍රික්කය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව. 1954රේ අංක 39 දරණ ඉඩම රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම වල විස්තර—

සැලැස්මේ අංකය : පී. පී. ඒ. 907. ගම—අටපන

| බිම්කට්ටි අංකය | ඉඩමේ නම | ඉඩමේ විස්තර | අයිතිකරු කියන්නන් | ඉඩමේ ප්‍රති ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1. | අටපනේ වත්ත ... | රබර් ... ... | කිතුල්ගල පදිංචි එච්. රාජකරුණා, ඕ. ආර. රාජකරුණා, ඩබ්ලිව්. රාජකරුණා, ඒ. රාජකරුණා, ඊ. ජී. රාජකරුණා, ටී. කොතලාවල නෝනාමහත්මිය, දෙස්තර ඇච්. ඇල්. රාජකරුණා සහ ඇච්. විරසේකර නෝනාමහත්මිය | 0 1.27·1 |
| 2. | ගොරකගහමුලවත්ත ... | සිමෙන්ති බැම්මකින් යුත් බෝ මලුවක්, ස්ථිර පායැල් ගොඩ නැගිල්ලක් හා ස්ථිර වැසිකිළි දෙකකින් යුත් කජු ගස් 11ක්, කොස් ගස් 8ක්, පොල් ගස් 7, පුවක් ගස් 10ක්, කිතුල් ගස් 7ක් හා දෙහිගසක්ද ඇති ඉඩමක් | කිතුල්ගල අටපන පදිංචි ඩී. ජී. සින්නප්පු, ඩී. ජී. සයිමන්, ඩී. ජී. චන්ද්‍රපාල, ඩී. ජී. අමරදාස, ඇස්. පී. විලියම් පෙරේරා, ඩී. ජී. අප්පු එතනා, ඩී. ජී. කොරනිස් අප්පු, ඩී. ජී. රංජැණිකා, ඩී. ජී. යසෝපාල, ඩී. ජී. සිද්දප්පු, ඩී. ජී. පියදාස. ඩී. ජී. සයිමන් සිංඤෝ, ඩී. ජී. සෝමාවති, සහ ඩී. ජී. කුසුමාවති | 1 2 0.1 |

ඉහත සඳහන් ඉඩම්වලට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958වේ සැප්තැම්බර් 11වැනි දින පූ.භා. 10ට කිතුල්ගල තානායමේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958වේ සැප්තැම්බර් 4වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

1958 ජූලි 21 වැනි දින,
කෑගල්ලේ කච්චේරිය.

ඇල්. බී. හුලන්ගමුව,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

අංකය : L.H. 923.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර—

කෑගල්ල දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරළයේ ප්‍රාදේශිය ආදයම් පාලක නිලධාරි තැනාගේ කොටසට අයත් බස්නාගිර කුන්පළාත පත්තුවේ අම්බල කන්ද ගමේ පිහිටා තිබෙන බර්විපිල්ඩ් වත්තෙන් අක්කර 6. රූඩ් 1. පර්චස් 37.8ක් පමණ ප්‍රමාණය ඇති බිම් කොටස.

අයිතිකම් කියන්නෝ—

(1) එන්. ජයසිංහ මහත්මි, අංක 12, පල්ලිය පාර, නුගේගොඩ
(2) ආර්. මලල්ගොඩ මහත්මී, ඇඩ්මන්ටන් පාර, කිරිල්ලපොන
(3) ඩී. ඩී. ඒ. ඇතුලත්මුදලි මහත්මයා, ප්ලවර්ස් ටෙරස්, කොල්ලුපිටිය
(4) ඩී. ඊ. පී. කරුණාරත්න මහත්මයා, ලැම්බර්ග්, අංක 31, නොරිස් කැනල් පාර, මරදන
(5) එන්. සී. කුරේ මහත්මි, චන්ද්‍රගිරි, බැරන්ඩියාවත්ත, වැල්ලම්පිටිය
(6) ආර්. වී. වීරකෝන් මහත්මී, වේවැල්දුව, කැළණිය
(7) යූ. එස්. කරුණාරත්න මහත්මයා, අංක14, ටර්නර් පාර, කොළඹ 8
(8) යූ. ඩී. ඩබ්ලිව්. සමරසේකර මහත්මයා, ටිවිංබෝන් පැසේජ්, මරදන

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958.9.4 වැනි දින පූ. භා. 10ට කෑගල්ලේ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958.8.27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූහැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958 ජූලි මස 24 වැනි දින,
කෑගල්ල කච්චේරිය.

ඩබ්ලිව්. ඊ. ජයසිංහ,
ආණ්ඩුවේ ඒජන්තතැනං

---

# ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ දැන්වීම්

## මධ්‍යම පංක්තිය සඳහා ඉඩම් කච්චේරියේ දැන්වීමයි

පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් රජයේ ඉඩම් දීමට ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. සියලුම ඉල්ලුම් පත්‍ර මෙහිදී තිබෙන අයදුම් පතේ විස්තර ප්‍රකාර යට සම්පූර්ණ කොට සබරගමු පළාතේ දිසාපතිතුමා වෙත 1958 අගෝස්තු මස 23 වෙනි දින දවල් 12ට මත්තෙන්. ලැබෙන්ට සැලැස් විය යුතුයි.

3. ඉඩම් ලබා ගැනීමට සුදුස්සන් තේරීම පිණිස, 1958 සැප්තැම්බර් මස 10 වෙනි දින පූර්වභාග 9.30 රත්නපුර කච්චේරියේදී ඉඩම් කච්චේරියක් පවත්වනු ලැබේ. සෑම අයදුම් කරුවෙක්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතු යි. එසේ නොහැකි නම්. තමන් වෙනුවට බලයලත් කෙනකු ඉඩම් කච්චේරියෙහි පෙනී නො සිටියොත්, එම ඉල්ලුම්කරු ඉඩම් ලබා ගැනීමට බලාපොරොත්තුවක් නැති ලෙස සලකනවා ඇත.

4. ඉඩම් දීමට තෝරාගත් සියලුම අයදුම් කරුවන්ට දැන්වූ විගස තමන්ට දෙන්න යන ඉඩමට අක්කරයට රුපියල් 3 බැගින් කච්චේරියේ තැන්පත් කළ යුතු යි. ඉඩම් මැනීමට අමතර වියදම් ආණ්ඩුවට දැරීමට අයදුම්කරුවාගේ නො සැළකිලි කමකින් සිදු වූවහොත්, ඉහත සඳහන් තැන්පත් කරන ලද මුදල් ආපසු නො දෙන බව සැලකිය යුතු යි. එසේ තැන්පත් කරන ලද මුදල් අයදුම්කරුවෙකුට දීමට හෝ නොදීමට ඉඩම් කොමසාරිස් තුමාගේ තිරණය අවසාන තීරණය බව සලකනවා ඇත.

5. පහත සඳහන් අයුරු වෂියකට ආදායම් ලබන අයදුම්කරුවන්ගේ අයදුම් පත්‍ර පමණක් සලකා බලනු ලැබේ. අවුරුද්දකට රු. 12,000කට අඩුවෙන් ආදායම තිබෙන අවිවාහක අය සහ අවුරුද්දකට රු. 24,000 කට අඩුවෙන ආදායම් තිබෙන විවාහක අයදුම්කරුවන්ට අක්කර 10 දක්වා ඉඩම් දෙනු ලැබේ. අන්තිමවරට ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් ලැබුණු තක්සේරු පත තමාගේ වාර්ෂික ආදායම් ඔප්පුකිරීම පිණිස ඉඩම් කච්චේරියේදී මාවෙත ඉදිරිපත් කළ යුතුයි. රත්නපුර දිස්ත්‍රික්කයේ අයදුම් කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර විශේෂයෙන් සලකා බලනු ලැබේ.

6. ඉඩම් සංවර්ධන ආඥ පණත යටතේ අක්කරයකට රු. 5 බැගින් බදු ගෙවිය යුතු යි.

7. උප ලේඛනයේහි සඳහන් ඉඩම්වල රබර් වැවීමට සාමාන්‍යයෙන් යෝග්‍ය බව දැන ගන්ට තිබේ. ඉඩම් දීමට තෝරා ගන්නා අය එම ඉඩම්වල සංවර්ධන වැඩ පිළිවෙලක් අනුව ස්ථිර බෝග වැවිය යුතු යි.

8. මේ පිළිබඳ වැඩිපුර විස්තර සබරගමු දිස්ත්‍රික්කයේ දිසාපති තුමාගෙන් ලබාගත හැක.

### උප ලේඛනය

ඇර්ජ්.පී.ඊ. 59. ගම—රත්නපුර දිස්ත්‍රික්කයේ, නවදුන් කෝරළයේ පල්ලෙපත්තුවේ, කෙහෙල්ඔව්විගම.

කැබැල්ල 59—ප්‍රමාණය අක්කර 30.

ඇල්. බී. අභයරත්න,
ආණ්ඩුවේ දිසාපති තුමා.

1958 ජූලි 21 දින,
කච්චේරිය, රත්නපුර.

### අයදුම් පත

(1) අයදුම්කරුගේ නම සහ ලිපිනය :————.

(2) ස්ථිර පදිංචිය :————.

(3) රක්ෂාව :————.

(4) ලාංකිකයෙක්ද යන වග :————.

(5) විවාහක, අවිවාහක යන වග සහ යැපෙන්නන්ගේ ගණන : ————

(6) ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් අන්තිම වාරයට තක්සේරු කළ තමන්ගේ වාර්ෂික ආදායමේ ප්‍රමාණය :————.

(7) තැන්පත් කර ඇති මුදලක් තිබේනම්, එය කොපමණද ? ————.

(8) ඉල්ලුම්කරුට අයත් පුද්ගලික ඉඩම්වල විස්තර හා එය කුමන අන්දමට ප්‍රයෝජන ගන්නෙහිද යන වග :————.

(9) ආණ්ඩුවේ බදු හෝ ඉඩම් සංවර්ධන ක්‍රමය යටතේ අයත් ඉඩම්වල විස්තර හා එය කුමන අන්දමට ප්‍රයෝජන ගන්නෙහිද යන වග ————.
ගොඩ ඉඩම් : අ.——, රූ.——, ප.——.
මඩ ඉඩම් : අ.——, රූ ——, ප.——

(10) වගා කිරීමට යෝජනා කරන බෝග කුමක් ද ? :————.

(11) අවුරුදු පතා මේ වෙනුවෙන් වියදම් කිරීමට පුළුවන් මුදල් කොපමණද ? :————.

(12) ගොවිතැන් පිළිබඳ දැනීම සහ පළපුරුදුකම් :————.

(13) අයදුම්කරුට ඉඩම් ලැබුණොත් එහි පදිංචිවීමට සූදානම්ද? : ————.

අයදුම් කරුගේ අත්සන :————.

දිනය :————.

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඇල්.කේ. 192

**අංක 21 (2) දරණ රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පළාතේ රඹෑවේ, 157 වැනි ගම් පිඹුරේ 1බී ඉසැඩි දරණ බිම් කට්ටියෙන් 25 × 60 පමණ ප්‍රමාණවූ ආණ්ඩුවේ බිම් කැබෙල්ලක් උප තැපැල් කන්තෝරුවක් පිහිටුවීම පිණිස, රඹෑවේ උප තැපැල් ස්ථානාධිපති ඩබ්ලිව්. ඇම්. සිරිසේන මහතා විසින් දීර්ඝකාලීන බද්දක් ඉල්ලා ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම ඉඩම 1951.3.4 වෙනි දින අංක 872/ඇන්.පී (ඊ) දරණ වාර්ෂික බල පත්‍රය යටතේ ඉහත කී ඉල්ලුම් කරුට දී තිබේ.

2. ඉල්ලුම්කර ඇති ඉඩම දීමට තිබේ. එය රජයේ සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් පහත සඳහන් කොන්දේසිවලටද යටත්කොට බදු දීමට යෝජනා කර ඇත :—

(අ) කාලය : 30 අවුරුද්දයි ;

(ආ) බද්ද අවුරුද්දකට රු. 22.50 යි ;

(ඇ) බදුකරු විසින් බද්ද ආරම්භවූ දින සිට අවුරුද්දක් ඇතුළතදී අනුරාධපුරයේ දිසාපති තුමාගේ සතුටට හේතුවන පරිද්දෙන් මෙම ඉඩමේ ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකළ යුතුයි.

(ඈ) බදුකරු එහි උප තැපැල් ස්ථානාධිපතිව සිටින තුරු මෙම ඉඩම උප තැපැල් කන්තෝරුවක් හා පදිංචි ස්ථානයකට විනා අන්කිසිවකට නොයෙදිය යුතුය. ඔහු උප තැපැල් ස්ථානාධිපති වශයෙන් කරන සේවය අවසන්වූ යම් වේලෙක සිට මෙම ඉඩම වෙළඳ හා වාසස්ථානයක් වශයෙන් හැර අන් දෙයකට නොයෙදිය යුතුය.

3. මෙහි සඳහන් දින සිට සති හයක් ඇතුළත මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගත හැකි කරුණු ලියවිල්ලකින් මා වෙත ඉදිරිපත් නොකළ හොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මැන්දිස්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

කොළඹ, 1958.8.1.

---

ඇල්. ජේ. 1492/ඇල්. ඇම්.

## 1948 ආණ්ඩුවේ ඉඩම් පිළිබඳ රෙගුලාසි මාලාවේ 21 (2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පල හත්පත්තුවේ යාය ගම පිහිටි 2,212 දරණ අවසාන ගම් පිඹුරයේ අංක 60 දරණ ආණ්ඩුවේ ඉඩම් කට්ටියෙන් අක්කර 2ක පමණ ඉඩම් කැබෙල්ලක්, කුරු/ගාමිණී පාසැල පිහිටුවීම පිණිස ලංකා බෞද්ධායතනයේ පාඨශාලා සාමාන්‍යධිකාරිතැන ඉල්ලා ඇති බව මෙයින් දැනුම් දෙමි.

2. ඉල්ලුම් කර ඇති ඉඩම අවශ්‍ය කාරණයට දීමට තිබේ. එසේම ඉල්ලීම පරිදි සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට ඉඩම බදු දීමට යෝජනාකර ඇත :—

(අ) බද්ද : අවුරුද්දකට රු. 16යි ;

(ඉ) කාලය : අවුරුදු 99යි ;

(උ) බදුගන්නන් විසින් බද්ද ආරම්භ වූ අවුරුදු 3ක් ඇතුළත මෙම ඉඩමෙහි කුරුණෑගල ආණ්ඩුවේ ඒජන්තගේ සිත් ගන්නා පරිද්දෙන් පාසැල් ගොඩනැගිල්ලක්, ගුරුවරුන් සඳහා නිවාස, වැසිකිළියක් හා ළිඳක් සෑදිය යුතුයි.

(එ) බදු ගන්නන් විසින් මෙම ඉඩම පාසැල සෑදීම පිණිස යොදනවා විනා අන්‍ය කටයුත්තකට නොයෙදිය යුතුයි.

3. මෙහි සඳහන් දින සිට සති හයක් ඇතුළත මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැණෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මැන්දිස්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1958 අගෝස්තු 1 වෙනි දින,
කොළඹදීය.

**දැන්වීම් සහ ප්‍රකාශණයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරණු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් පළ කරනු ලබන්නේ **ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30 ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශණයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශණ, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරණු නොලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශණයන් සඳහා **1958 ජනවාරි 1 වැනි දින සිට** අය කරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට... ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුවම අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරණ දින තුනකට ප්‍රථම පස්වරු 4ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් **කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... ... | එක් කාණ්ඩයක් සඳහා... | 15 | 0 |
| | 1වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට... ... | ... ... | 0 | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 31 |
| 1 වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... ... | ... ... | 0 | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 14 |

15. පරණ ගැසට් කොපි තිබේනම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය **කොළඹ, රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන්** ඉල්ලුම් කළ යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී